# Project 298
# 298 වන ව්‍යාපෘතිය

DP EDUCATION Coding School





thunkable

LIVEWORKSHEETS

- ඔබගේ ඇස්වල colors හඳුනාගැනීමට ඇති හැකියාව පරීක්ෂා කිරීමට App එකක් නිර්මාණය කරමු.
- මෙම link හරහා ලබා දී ඇති images download කරගන්න.

  https://drive.google.com/drive/folders/18R5TA2c6Sa4sRJEc3ATXhqiCtbJ6VXge?usp=sharing

- එහි design එක සඳහා screen 4ක් අවශ්‍ය වේ.
- Screen 1 හි Topic එක සඳහා label එකක් යොදාගෙන text එක ලෙස "Color Blind Test" ලබාදෙන්න.
- මීලගට Image block එකක් ගෙන ඒ සඳහා ඔබට ලබා දී ඇති image යොදන්න.
- Button එක සඳහා "Color Blind Test" ලෙස ලබාදෙන්න.




LIVEWORKSHEETS

❖ මීලගට test සඳහා screen එක නිර්මාණය කරමු. ඒ සඳහා images index එක පෙන්වීම සඳහාත් “color blind test” ලෙස පෙන්වීම සඳහාත් labels 2ක් ස්ථානගත කරන්න.

❖ Image සඳහා image block එකක් drag කර එය empty ලෙස තබන්න. එය සඳහා images ලබා දෙන්නේ app එක run වන විටයි. ඔබට ලබා දී ඇති images සියල්ල thunkable වෙත upload කරගන්න.

❖ ඉහත image එක හරහා පෙන්වන්නේ යම් තාක් දුරට blur කරන ලද ඉලක්කමක් වන අතර එම ඉලක්කම කුමක් දැයි input box එකෙහි type කළ යුතුය.

❖ ඒ සඳහා input box එකක් ලබාගන්න. එහි type කරන numbers delete කිරීමට delete button එකක් add කරන්න.

❖ ඉලක්කම හඳුනාගත නොහැකි Images skip කිරිම සඳහා >> (skip) button එකත් ලබාදුන් ඉලක්කමේ නිවරැදිතාවය පරීක්ෂා කර මීලග image එකට යාමට ✓ ලෙස button එකකුත් නිර්මාණය කරන්න.




❖ මීලගට image numbers 8ක් හෝ ඊට වැඩි ගණනකට නිවරැදි පිළිතුරු ලබාදුනි නම් You are passed ලෙස පෙන්වීමට screen එකක් නිර්මාණය කරන්න.

LIVEWORKSHEETS





- මීලගට image numbers 7ක් හෝ ඊට අඩු ගණනකට නිවරැදි පිළිතුරු ලබාදුනි නම් You have vision problem ලෙස පෙන්වීමට screen එකක් නිර්මාණය කරන්න. නැවත මුල් පිටුවට යාමට ඒ තුළට Run Color Blind Test again.. button එකක් යොදන්න.




- මීලගට code කොටස නිර්මාණය කරමු.
- Screen 1 සිට screen 2 වෙතට යාමට පහත පරිදි block යොදන්න.


LIVEWORKSHEETS





- Images එකින් එක පෙන්වීම සඳහා අදාළ button click කරන විට index එක 1 සිට එකින් එකට වැඩි විය යුතුය. ඒ වගේ ම images 1 සිට 10 දක්වා name කර ඇත. ඒ සඳහා Screen 2 හි index සඳහා  variable එකක් නිර්මාණය කර 1 ලෙස initialize කරන්න.
- ඒ වගේම total සඳහා ද variable එකක් නිර්මාණය කරගන්න.





- Screen 2 open වන විට image එක insert වීම සඳහා index variable එක සහ file format එක (.jpg) යොදා පහත පරිදි block යොදන්න. ඒ වගේම index අගය 10 හෝ ඊට අඩු නම් ඉහළ වම් පසින් එය display වීම සඳහා පහත පරිදි block යොදන්න.




- >> (skip) button click කළ විට index variable එක එකින් එක වැඩි විය යුතුය. පසුව ඊට අදාළ image එක display කරන්න. මීළගට total එක 9 හෝ ඊට වැඩි නම් සහ index එක 10 ට වැඩි නම් screen 3 යායුතුය.  total එක 8 හෝ ඊට අඩු නම් සහ index එක 10 ට වැඩි නම් screen 4 යායුතුය. ඒ වගේ ම index එක 10 හෝ ඊට අඩු නම් label 4 හි index එක display යුතුය. පසුව text_input හි type කර ඇති අගය empty විය යුතුය.





❖ මීලගට answer check කිරීම සඳහා checkAnswer function එක නිර්මාණය කරමු. Index variable එක 1 සහ text_input හි අගය 31 නම් total එක 1කින් වැඩි විය යුතුය. මේ ආකාරයට index=2 and text_input =29, index=3 and text_input =34, index=4 and text_input =54, index=5 and text_input =31, index=6 and text_input =59, index=7 and text_input =22, index=8 and text_input =34, index=9 and text_input =68 හා index=10 and text_input =23 යන සියලු අවස්ථාවලදී total එක 1කින් වැඩි විය යුතුය.





LIVEWORKSHEETS

❖ √ (නිවරදිතාව පරීක්ෂා කිරීම) button click කළ විට checkAnswer function එක run විය යුතුය. එමෙන්ම index variable එක එකින් එක වැඩි විය යුතුය. පසුව ඊට අදාළ image එක display කරන්න. මීලගට total එක 9 හෝ ඊට වැඩි නම් සහ index එක 10 ට වැඩි නම් screen 3 යායුතුය. total එක 8 හෝ ඊට අඩු නම් සහ index එක 10 ට වැඩි නම් screen 4 යායුතුය. ඒ වගේ ම index එක 10 හෝ ඊට අඩු නම් label 4 හි index එක display යුතුය. පසුව text_input හි type කර ඇති අගය empty විය යුතුය.




❖ මීලගට delete button එක click කළ විට text_input හි අගය empty විය යුතුය.




LIVEWORKSHEETS